00189

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ**
**ඩිප්ලෝමා වැඩ සටහන - 3 වන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2014**

**ESD1131 – මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන පර්යාලෝක**

**කාලය - පැය 02යි.**

---

**දිනය - 2014.11.15** **වේලාව - ප.ව. 02.00 - ප.ව.04.00 දක්වා**

---

**I වන කොටසේ සියළුම ප්‍රශ්නවලටද II වන කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටද (03) පිළිතුරු සපයන්න.**

## I කොටස

01. දරුවකුගේ පූර්ණ සංවර්ධනයට අයත්වන ප්‍රධාන පැතිකඩ හතර (04) දක්වන්න.

02. "සැමට අධ්‍යාපනය" යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ශ්‍රී ලංකාවේ පූර්ව ළමාවිය අධ්‍යාපනය ආශ්‍රිතව දැකිය හැකි ගැටළු **පහක් (05)** ලියන්න.

04. ශ්‍රී ලංකාවේ ළමා ලේකම් කාර්යාලයේ මූලික කාර්යයන් පහක් (05) ලියන්න.

05. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක පවත්වාගත යුතු මූලික ප්‍රමිතින් පහක් (05) ලියන්න.

06. 1972 වසරේ සිදු කරන ලද ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළින් හඳුන්වා දුන් සමෝධානිත ප්‍රවේශයේ ප්‍රධාන අරමුණු පහක් (05) දක්වන්න.

07. අධ්‍යාපනයේ පොදු නිපුණතා පහක් (05) දක්වන්න.

08. පෙර පාසලක් තුළ ප්‍රීතිමත් ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමේ වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## II කොටස

09. (i) 'ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය' යන යෙදුම කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 04)

(ii) ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේදී ගුරුවරයාගේ භූමිකාව කෙසේ විය යුතුදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික අවධිවල දරුවාගේ සංවර්ධනයට ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම කෙතරම් වැදගත් වන්නේ දැයි සුදුසු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

10. (i) පවුල යන යෙදුම නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) සාම්ප්‍රදායික පවුලේ භූමිකාව වර්තමානයෙහි වෙනස් වී ඇති ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) මෙම වෙනස්කම් කෙරෙහි බලපෑ සාධක දක්වන්න. (ලකුණු 03)

(iv) පවුලේ සාම්ප්‍රදායික භූමිකාව වෙනස්වීම හේතුවෙන් දරුවන් හදාවඩා ගැනීමේ දී දෙමාපියන් මුහුණපාන ගැටළු හතරක් (04) උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 10)

11. (i) ප්‍රාථමික අධ්‍යාපනයේ මූලික අවධි 03 දක්වන්න. (ලකුණු 04)

(i) ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය ආශ්‍රිත ගැටලු 03 ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii) 1999 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුලින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධනයට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 10)

12. (i) "විශේෂ තත්ත්වයන් යටතේ ස්ථානගත වූ ළමයි"යන යෙදුම නිර්වචනය කරන්න.

(ලකුණු 04)

(iii) ලිංගික අපයෝජන හා අතවරවලට ලක් වූ දරුවන් තුල දැකිය හැකි ගැටලු 04 ක් දක්වන්න. (ලකුණු 08)

(iii) ඉගෙනුම් ඌනතා සහිත දරුවන්ගේ පූර්ණ සංවර්ධනය ඇති කිරීමේ දී ගුරුවරයකු වශයෙන් ඔබට ගත හැකි උපාය මාර්ග යෝජනා කරන්න.

(ලකුණු 08)

13. පහත දැක්වෙන මාතෘකා දෙකක් (02) ක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) විශේෂ අවශ්‍යතා ඇති ළමුන්

(ii) කේවල දෙමාපිය පවුල්

(iii) මුල් ළමාවිය අධ්‍යාපනය සඳහා නිර්මාණාත්මක ඉගෙනුම් පරිසරයක් තිබීමේ වැදගත්කම

(iv) මුල් ළමාවියේ දී ස්වයං ඉගෙනුමෙහි ඇති වැදගත්කම

(ලකුණු 10x 2 = 20)

- හිමිකම් ඇවිරිණි. -

00189

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**FINAL EXAMINATION – 2014**

**DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION – LEVEL 3**
**ESD1131 – PERSPECTIVES IN EARLY CHILDHOOD AND PRIMARY EDUCATION.**
**DURATION – TWO (02) HOURS.**

---

Date: 15th November 2014 Time: 2.00 p.m.- 4.00 p.m.

---

Answer all questions in Part I and any three from Part II.

## PART I

01. State **four (04)** main profiles of the total development of a child.

02. Explain briefly the concept "Education for all"

03. Write **five (05)** problems that can be seen in Early Childhood Education in Sri Lanka.

04. Write **five (05)** main tasks of the Child Secretariat in Sri Lanka.

05. State **five (05)** standards that should be maintained by a Day care Center.

06. State **five (05)** main objectives the integrated approach of 1972 Education reforms in primary education.

07. State **five (05)** common competencies in education.

08. Briefly explain the importance of creating a joyful learning environment in a pre-school.

(05 x 08 = 40 marks)

## PART II

09. i. Briefly explain the term "Student Centred Education"

(04 marks)

ii. Explain the role of the teacher when planning and implementing an activity based teaching-learning process.

(06 marks)

iii. Explain with suitable examples, the importance of activity based learning in child's development in pre-primary and primary stages.

(10 marks)

10. i. Define the term "Family"

(03 marks)

ii. Explain in brief the traditional role of the family has changed at present?

(04 marks)

iii. State the factors which influenced these changes.

(03 marks)

iv. Describe citing examples the problems faced by parents when raring their children due to the changes of the traditional role of the family.

(10 marks)

11. i. State **three (03)** key stages in Primary Education.

(04 marks)

ii. Explain in brief **three (03)** problems in Primary Education in Sri Lanka.

(06 marks)

iii. Describe the measures taken by 1999 education reforms to develop Primary Education in Sri Lanka.

(10 marks)

12. i. Define the term "Children placed in Special circumstances"

(04 marks)

ii. State **four (04)** problems which might emerge in children who are affected by sexual abuse and harassment.

(08 marks)

iii. Propose strategies which you could implement as a teacher towards the total development of children with learning impairment.

(08 marks)

13. Write brief notes on any **two (02)** of the following topics.
   i. Children with Special Needs.
   ii. Single parent families.
   iii. Importance of creative learning environment in Early Childhood Education.
   iv. Importance of self learning in early childhood period.

(10 x 2 = 20 marks)

- Copyright reserved -